# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2339/03 - 2023 ජූලි මස 04 වැනි අඟහරුවාදා - 2023.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන අධිකාරිය හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මැයි මස 30 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - PG 6376 — 21 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### *කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභා ඔඩ්ඩමාවඩි නාගරික බල ප්‍රදේශය*

*I වැනි තීරුව*

නැගෙනහිර පළාත්, මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ අංක 207 මීරවොඩයි බටහිර, අංක 207B මීරවොඩයි නැගෙනහිර, අංක 208B ඔට්ඩමාවඩි දකුණ, අංක 208C ඔඩ්ඩමාවඩි 2, අංක 210A කාලිච්චායි, අංක 210A/1 මඩමුණයි, අංක 210E පූනායි බටහිර, අංක 207A මන්චෝලයි, අංක 208 ඔඩ්ඩමාවඩි 03, අංක 208B/2 ඔඩ්ඩමාවඩි උතුර, අංක 210B කඩදාසි නගරය, අංක 210 වහනේරි, අංක 210A/2 උත්තුචේනයි, අංක 210C තියාවඩ්ඩවාන් යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට අයත් වන්නා වූ කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වැනි තීරුවේ විස්තර වන ඉම් සලකුණු හා මායිම් වලින් සමන්විත වූ මුළුමහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

*උතුර:*

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අංක 275 බෝ-අත්ත ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම සහ මඩකලපු දිස්ත්‍රික්කයේ අංක 210A කලිච්චායි ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය වන ලක්‍ෂ්‍යයෙන් පටන්ගෙන එතැන් සිට කෝරළෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර, එතැන් සිට මාදුරුඔයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර, එතැන් සිට බටහිර කෝරළෙයිපත්තුව ප්‍රාදේශීය සභාවේ උතුරු මායිම ඔස්සේ ගමන් කර, අංක 205C නසිවන්තිවු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්‍ෂ්‍ය දක්වා ද වේ.

*නැගෙනහිර :*

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කෝරළෙයිපත්තුව බටහිර ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර කෝරළෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ (වාලච්චානයි) බටහිර මායිම ඡේදනය වන ලක්‍ෂ්‍ය ද වේ.

*දකුණ :*

අවසන් වරට සඳහන් කළ ලක්‍ෂ්‍යයේ සිට කෝරළෙයිපත්තුව බටහිර ප්‍රාදේශීය සභාවේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර, එතැන් සිට මාදුරුඔයේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර, කෝරළෙයිපත්තුව බටහිර ප්‍රාදේශීය සභාවේ දකුණු මායිම ඔස්සේ ගමන් කර, පොළොන්නරුව දිස්ත්‍රික්යේ, අංක : 255 ගොම්පතියාය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්‍ෂ්‍ය දක්වා ද වේ.

*බටහිර :*

අවසන්වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කෝරළයිපත්තුව බටහිර ප්‍රාදේශීය සභාවේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර ආරම්භක ලක්‍ෂ්‍ය දක්වා ද වේ.

EOG 07-0002

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.